# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.09.26 පැය 2350 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/1802/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**රඳවාගෙන සිටි සැකකරුවෙකුගෙන් අපරාධ රැසක් අනාවරණය වීම - කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2025.09.22 වන දින වත්තල පොලිස් වසමේ ඇලකන්ද ප්‍රදේශයේදී කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන ජාවාරම් කිරීම සම්බන්ධයෙන් වයස අවුරුදු 45 ක් වන උතුරු මුල්ලේරියාව ප්‍රදේශයේ පදිංචි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වත්තල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර තිබිණි.

සැකකරු 2025.09.23 වන දින වැලිසර ගරු මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර දින 07 ක් රැඳවුම් නියෝග ලබා ගෙන සිදු කරන ලද ප්‍රශ්ණ කිරීම්වලදී මොහු දිවයිනේ විවිධ ප්‍රදේශයන්වල කොල්ලකෑම් හා වෙඩි තැබීම් සම්බන්ධයෙන් අවශ්‍ය කරන අපරාධ රැසකට සම්බන්ධ සැකකරුවෙකු බවත්, මොහු විදේසගතව සිටින සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සමඟ සමීප සම්බන්ධතා පවත්වන අයෙකු බවටත් අනාවරණය වී ඇත.

**සැකකරුගෙන් මේ වන විට අනාවරණය කරගත් අපරාධ පහත පරිදි වේ.**

- 2025.06.30 වන දින කිරිබත්ගොඩ පොලිස් වසමේදී කාන්තාවකගේ ගෙල බැඳි රන් මාලය කොල්ලකෑමේ අපරාධය සඳහා පැමිණි යතුරුපැදියේ පැදිකරු බවට අනාවරණය වී ඇත.

- 2025.07.03 වන දින කඳාන පොලිස් වසමේදී වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදු කර තවත් දෙදෙනෙකුට තුවාල සිදු කිරීමේ අපරාධය සඳහා පැමිණි යතුරුපැදියේ පැදිකරු බවට අනාවරණය වී ඇත.

- 2025.08.07 වන දින කඳාන පොලිස් වසමේදී නිවසකට වෙඩි තැබීමේ අපරාධයේ වෙඩික්කරු බවට අනාවරණය වී ඇත.

- 2025.09.06 වන දින මීගමුව පොලිස් වසමේදී නිවසකට වෙඩි තැබීමේ අපරාධයේ වෙඩික්කරු බවට අනාවරණය වී ඇත.

විදෙස්ගතව සිටින සංවිධානාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් තිදෙනෙකුගේ මෙහෙයවීම මත මෙම සැකකරු විසින් ඉහත අපරාධ සිදු කර ඇති බවට වැඩිදුර

විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර අපරාධ සඳහා යොදා ගත් යතුරුපැදියක්ද විමර්ශන නිලධාරීන් විසින් සොයාගෙන වත්තල පොලිස් ස්ථානය වෙත ඉදිරපත් කර ඇත.

කැලණිය කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය මඟින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**